
මානව හිමිකම් රාමුවක් මත පදනම් වූ,
සමාජ වගකීමක් සහිත
සමාජ මාධ්‍ය භාවිතාවක් සඳහා...



COLOMBO | 2019 - 2024

# social media declaration

Version 2.0

#EngageSMinSL

සමාජ වගකීමක් සහිත
සමාජ මාධ්‍ය භාවිතාවක්
සඳහා වන ආචාරධර්ම පද්ධතිය

# Digital Rights are Human Rights

# පසුබිම

සමාජ මාධ්‍ය යනු විවිධාකාර වූ, අන්තර්ජාලය පදනම් කරගත් Apps, වෙබ් අඩවි සහ වේදිකා වන අතර එමඟින් පරිශීලකයන්ට එකිනෙකා සමඟ අන්තර්ක්‍රියා කිරීමට, අන්තර්ගත නිෂ්පාදනය කිරීමට, ඉදිරිපත් කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ඉඩදෙනු ලැබේ. එසේම, අනෙකුත් දේවල් අතර, දේශීය, ජාතික, කලාපීය සහ ගෝලීය වශයෙන් ප්‍රේක්ෂකයන් සමඟ සම්බන්ධ වීමේ හැකියාව ලබා දේ.

භූගෝලීය මායිම්වලින් සීමා නොවී, සමාජ මාධ්‍ය භාවිතා කරන්නෝ බොහෝ විට තම රට, ප්‍රජාව හෝ සමාජ-දේශපාලන සන්දර්භය සපයන ප්‍රමාණයෙන් ඔබ්බට "අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස" භුක්ති විඳිති. මෙම විවෘතභාවය ස්වභාවයෙන්ම ධනාත්මක සහ ඍණාත්මක යන දෙයාකාරයෙන්ම වේ. සමහර පරිශීලකයෝ හරයාත්මකව, ප්‍රගතිශීලී, ගෞරවනීය ආකාරයකින් අදහස් ප්‍රකාශ කරති. තවත් අය එසේ නොවේ. ඇතැමුන් සමාජ මාධ්‍ය භාවිතා කරන්නේ සමාජීය අරමුණු සඳහා සහ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා ය. තවත් සමහරු එය සමාජ සංහිඳියාව අඩපණ කිරීමට සහ බෙදීම් තවත් වැඩි කිරීමට භාවිතා කරති.

සමාජ මාධ්‍ය, පුළුල් පරාසයක සංවාදවලට සහ සමාජ අන්තර්ක්‍රියාවලට සක්‍රීයව සහභාගීවීමට එහි පරිශීලකයන්ට අවස්ථාව ලබා දෙයි. දැනුම බෙදාහදා ගැනීම, විවේචනාත්මක සංවාද නිර්මාණය කිරීම, අධිකාරිවාදී මනෝභාවයන් ප්‍රශ්න කිරීම සහ විකල්ප කතිකාවන් ගොඩනැගීම සඳහා ලේඛනයේ සිට දෘෂ්‍යරූප දක්වා ප්‍රකාශන ක්‍රම භාවිතා කළ හැකිය. සාමූහික ක්‍රියාකාරීත්වය, සාක්ෂි දැරීම සහ සංවිධානය කිරීම මෙන්ම තීරණාත්මක සිදුවීම් සහ සිද්ධීන් පිළිබඳ අදහස් ඉදිරිපත්

කිරීමට ද සමාජ මාධ්‍ය ඉඩ සලසනු ලැබේ. විවිධ භූගෝලීය කලාප, කාල කලාප සහ රටවල් පුරා විසිරී සිටින මැදිහත්කරුවන් සහ නිෂ්පාදකයන් පොදු අවකාශ තුළ අදහස් අඛණ්ඩව ඇගයීම හෝ විවේචනය කිරීම හේතුවෙන් බොහෝ විට භූගෝලීය, දේශපාලනික සහ අනෙකුත් භෞතික සීමාවල දී බාධාවකින් තොරව මෙම අන්තර්ක්‍රියා සිදු වේ.

ඒ අතරම, දිගු කාලීනව වඩාත් පසුගාමී, මර්දනකාරී සහ කැරලිකාරී සමාජයක් නිර්මාණය කිරීමට දායක වෙමින් සමාජ මාධ්‍ය හරහා ප්‍රකාශයට පත්කරන ලද හෝ ප්‍රවර්ධනය කරන ලද අන්තර්ගතයන් බොහෝ විට මහජන යහපතට, අහිතකර සමාජ-දේශපාලන විෂමතා ඇති කිරීම හෝ උග්‍ර කිරීමද කරනු ලබයි.

ශ්‍රී ලංකාව තුළ පවා සමාජභාවය, ජාතිකත්වය, ආගම, කුලය හෝ ලිංගික දිශානතිය පදනම් කරගනිමින් වෛරය සහ ප්‍රචණ්ඩත්වය අවුලුවන අන්තර්ගතයන් හරහා අන්තර්ජාලය තුළින් සිදුවන හානි සීඝ්‍රයෙන් ඉහළ යන බව කනස්සල්ලෙන් යුතුව වුවත් අපට සටහන් කිරීමට සිදු වේ. තමන්ගේ පටු අරමුණු සහ වාසි තකා සමාජ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් ඉහළ බලපෑම්කිරීමේ හැකියාවක් ඇති පුද්ගලයන් කිහිප දෙනෙක් ම ඔවුන්ගේ වේදිකාවල ඇති විරුද්ධ මත, කොන් කිරීම හෝ ප්‍රචණ්ඩ ලෙස මකා දමමින් සිටිති. ලොව පුරා වාර්තා පෙන්වා දෙන්නේ සමාජ මාධ්‍යවල හානිකර බලපෑම් සහ අනිසි භාවිතයට, නවීන දේශපාලන බලපෑම් ව්‍යාපාර, සාවද්‍ය තොරතුරු සේම වැඩි වැඩියෙන්, පොදු යථාර්ථයන් යටපත් කිරීම සඳහා AI (Artificial Intelligence) උත්පාදක (Generative) පදනම් වූ කෘතිම මාධ්‍ය භාවිතය හේතු වන බවයි. එබැවින් ධ්‍රැවීකරණය සහ සත්‍ය වසන් කිරීම සඳහා සමාජ මාධ්‍ය භාවිතා කිරීමත් සමඟ ප්‍රජාතන්ත්‍රවාදී පදනම් අවදානමට ලක්ව ඇත.

ආණ්ඩු සහ සමාජ මාධ්‍ය සමාගම් මෙම වර්ධනය වන අභියෝගවලට මුහුණ දීමට දැඩි උත්සාහයක යෙදී සිටිති. ඔවුන් කරන්නේ යැයි සමාජ මාධ්‍ය වේදිකා තුළ පවසන දේ බොහෝ විට ඔවුන් ඇත්ත වශයෙන් ම කරන දෙයින් බොහෝ දුරස් වේ. අනෙක් අතට, අත්තනෝමතික පාලන තන්ත්‍ර, අන්තර්ජාලය හරහා ප්‍රචාරණය පුළුල් කරන අතරතුර, විසම්මුතික අදහස් නිශ්ශබ්ද කිරීම අරමුණු කරගත් නීති සම්පාදනය කිරීමට Disinformation හේතුවෙන් ඇති වන තර්ජන අවභාවිතා කරයි. කාන්තාවන් සහ ළමුන් ආරක්ෂා කිරීමේ මුහුණුවරින් නමුත් "ප්‍රකාශනයේ නිදහස" සම්පූර්ණයෙන් ම මැඩපැවැත්වීම සඳහා නීති සම්පාදනය කිරීම සම්බන්ධයෙන් වන ප්‍රබල උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ මින් පෙර නොතිබූ සහ භයංකාර "මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත" (Online Safety Act No, 9 OF 2024 [OSA]) දැක්විය හැක.

**මෙම ප්‍රකාශනය, සමාජ මාධ්‍ය තුළ හෝ ඒ හරහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසේ නොබිඳිය හැකි වැදගත්කම හඳුනා ගැනීමේ උත්සාහයක් වන අතර, ආචාරධාර්මික, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජ වගකීම සහ යහපත අරමුණු කරගත් සමාජ මාධ්‍ය භාවිතය දිරිමත් කිරීම සහ ශක්තිමත් කිරීම ද සිදු කරයි.**



# අරමුණ

සමාජ මාධ්‍ය වගකීමෙන් යුතුව ආචාරධාර්මිකව භාවිතා කිරීම දිරිමත් කරන ප්‍රජාවක් පෝෂණය කිරීම සහ ප්‍රවේශ වීමේ අයිතිය සහ තොරතුරු මත පදනම් වූ සමාජයකට ඉඩ සැලසීම සඳහා ඩිජිටල් සාක්ෂරතාව ශක්තිමත් කිරීමත්, ඒත් සමගම සමාජ මාධ්‍ය අනිසි ලෙස භාවිතා කිරීමට ඉඩකඩ ඇති බව පිළිගන්නා අතර ම, මෙම ප්‍රකාශනය විසින් ඩිජිටල් අයිතීන්, 'මානව හිමිකම්' රාමුවක් මත පදනම් වූ, සමාජ සාධාරණත්වය, මානව ගරුත්වය සහ මූලික මානව සහ සමාජ පරමාදර්ශ මත ගොඩනගන ලද සමාජයක අවියෝජනීය කොටසක් ලෙස පිළිගනී.

# කවුද?

මේ සදහා අත්සන් තබනු ලැබූ අය අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ මෙම රාමුව සියලුම සමාජ මාධ්‍ය වේදිකා සහ ඩිජිටල් අවකාශ හරහා මෙන්ම සාම්ප්‍රදායික මාධ්‍ය ධාරාවේ, අවකාශ තුළ ඔවුන්ට හැකි සෑම විටම ප්‍රවර්ධනය කරනු ඇත.

# ඇයි?

- අන්තර්ජාලය හරහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇතුළු මානව අයිතිවාසිකම් සීමා කිරීම අරමුණු කරගත් නෛතික හෝ වෙනත් ක්‍රම සඳහා විකල්පයක් ලෙස,
- සමාජ මාධ්‍ය හරහා ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී සංවාද අවකාශයක් ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ට උපකාර කිරීමේ වේදිකාවක් ලෙස මෙන්ම, තමන්ගේ මතයට වඩා වෙනස් අදහස් ඇති අය කෙරෙහි ගෞරවනීය තත්ත්වයක් පවත්වා ගනිමින් අදහස් මත ගොඩනැගුන ශක්තිමත් සංවාදයක් දිරිමත් කරන වේදිකාවක් ලෙස,
- සමාජ මාධ්‍යවල අචාරධාර්මික, ප්‍රජා මාර්ගෝපදේශ සහ වගකීම් සහගත භාවිතය පිළිබඳව දැනුවත් කිරීම සඳහා වන මෙවලමක් සහ රාමුවක් ලෙස,

# අචාරධර්ම සංග්‍රහය

**සෑම විටම අප අයත් වන හෝ සම්බන්ධ සියලුම සමාජ මාධ්‍ය වේදිකා සහ අවකාශ හරහා, පහත සඳහන් දෑ නිෂ්පාදනය කිරීම සහ ව්‍යාප්තිය අවම කිරීමට/ අවසානයේ ඒවා මුලිනුපුටා දැමීමට උපරිමයෙන් අපි ක්‍රියා කරන්නෙමු:**

- ජාතිය, ආගම හෝ කුලය මත පදනම්ව වෙනස්කොට සැළකීම,
- සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (ලිංගභේදය, ලිංගික හිංසනය, ස්ත්‍රී විරෝධීත්වය සහ කැමැත්ත ලබා ගැනීමෙන් තොරව සංවේදී රූප (non-consensual intimate imagery - NCII) වීඩියෝ සහ වෙනත් අන්තර්ගතයන් බෙදා හැරීම ඇතුළුව) සහ කාන්තාවන්ට එරෙහි වෙනත් ආකාරයේ වෙනස්කොට සැළකීම,
- Generative AI හරහා සකසන ලද කෘතිම මාධ්‍ය අන්තර්ගතයන් ඇතුළුව ලිංගික අපයෝජන, සහ NCII රූප හෝ ළමා ලිංගික අපචාර අන්තර්ගත (child sexual abuse material - CSAM) බෙදා ගැනීම,
- ලිංගික දිශානතිය හෝ සමාජභාවය මත පදනම් වූ හිරිහැර,
- වෛරය හෝ ප්‍රචණ්ඩත්වය, තර්ජන, බිය ගැන්වීම්, සයිබර් අවකාශ තුළ හිරිහැර කිරීම් සහ බිය උපදවන කථනය,
- ආන්තික ප්‍රජාවන්ට හිරිහැර කිරීම,
- නීති විරෝධී ක්‍රියා,
- දත්ත සොරකම් කිරීම සහ තොරතුරු සහ මාධ්‍ය මූලාශ්‍ර සදාචාර විරෝධී ලෙස අපයෝජනය කිරීම (අවසරයකින් තොරව ඡායාරූප භාවිතා කිරීම වැනි දේ)
- Misinformation"Disinformation ඇතුළු නොමග යවනසුළු අන්තර්ගතයන්,

**මානව හිමිකම් මත පදනම් වූ රාමුවක් භාවිතා කරමින් සමාජ මාධ්‍යවල වගකීම් සහගත, ආචාරධාර්මික සහ ප්‍රජාතන්ත්‍රවාදී භාවිතය වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් දෑ ප්‍රවර්ධනය කිරීමට අපි එකඟ වන්නෙමු:**

- විවෘත, නිදහස් අන්තර්ජාලයක්, තොරතුරු දැනගැනීමේ අයිතිය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම සහ සහතික කිරීම,
- තොරතුරු දැනගැනීමේ අයිතිය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස අහිමි කළ නොහැකි ඩිජිටල් අයිතීන් ලෙස ආරක්ෂා කර සහතික කිරීම,
- ආන්තික හඬවලට ඉඩ දෙන සමාජ මාධ්‍ය අවකාශ, අවස්ථා සහ වේදිකා සංරක්ෂණය කර ආරක්ෂා කිරීම සහ ඒවාට පිවිසීමේ අවකාශය සාධාරණ පිරිවැයකට යටත් වීම,
- මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම,
- ආන්තික සහ අවදානමට ලක් විය හැකි ප්‍රජාවන්, විශේෂයෙන් ම ස්ත්‍රී විරෝධී ප්‍රවණතා, ලිංගිකත්වය, LGBTQIA+ විරෝධී, සහ අනෙකුත් සංඛ්‍යාත්මකව සුළු ජාතීන් වෙත එල්ල වන ප්‍රචණ්ඩ තර්ජන සහ අවදානමට ලක්විය හැකි අනන්‍යතා සඳහා ස්ථාවර, ආරක්ෂිත සහ ඔවුන්ව පිළිගන්නා සමාජ මාධ්‍ය අවකාශයක් සැකසීම, පහසුකම් සැළසීම සහ වෙනුවෙන් පෙනී සිටීම,
- පෞද්ගලිකත්වත්වයට ඇති අයිතියට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම, දත්ත භාවිතා කිරීම සම්මුතිවාදී තත්ත්වයත්, අත්‍යාවශ්‍යය සහ සමානුපාතික විය යුතු මෙන්ම තමන්ගේ දත්ත සම්බන්ධයෙන් සම්පූර්ණ පාලනය ඇති, පරිශීලකයන්ට විනිවිද පෙනෙන ප්‍රවණතා (Transparency) ප්‍රවර්දනය කිරීම,

# සමාජ මාධ්‍ය වේදිකාවල වගකීම්

- තොරතුරුවල පරිපූර්ණ බව (නිරවද්‍යතාව, අනුකූලතාව, විශ්වසනීයත්වය, ආරක්ෂාව, විනිවිදභාවය) සහ මානව හිමිකම්වලට ගරු කිරීම, සමාජ මාධ්‍ය මගින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට සහ පරිශීලකයන් සවිබල ගැන්වීමේ මූලධර්ම ආරක්ෂා කිරීම,
- Content Moderation හි ප්‍රමිතිය වැඩි කිරීම සඳහා දේශීය භාෂා (සිංහල සහ දෙමළ යන දෙකම) ධාරිතාවය පුළුල් කිරීම,
- ශ්‍රී ලංකා සන්දර්භය, පරිශීලකයන්ගේ සමාජභාවය භාවය, භාෂා ධාරිතාව සහ ඔවුන් සිටින කාල කලාප සම්බන්ධයෙන් පරිශීලක-ජනක වාර්තා (User generated reports) සමඟ කටයුතු කිරීමට පවරා ඇති පරිපාලකයන් සංඛ්‍යාව පිළිබඳව විනිවිදභාවයක් තිබීම,
- පැය 24කට අඩු කාලයකදී ප්‍රචණ්ඩත්වය සහ ද්වේෂ සහගත හැසිරීම් අවුස්සන වෛරී ප්‍රකාශ ඉවත් කිරීම සඳහා වලංගු දැනුම්දීම් (valid notifications) බහුතරයක් සමාලෝචනය කිරීමට අවශ්‍ය නම්, එම අන්තර්ගතයට ප්‍රවේශය ඉවත් කිරීමට හෝ දුබල කිරීමට නිශ්චිතව කැපවීම, උග්‍ර ප්‍රචණ්ඩත්වය ඇති තත්ත්වයක් අතරතුර, මෙම කාල රාමුව තවත් අඩු කළ යුතුය.
- සේවාවන්හි, වෛරී ප්‍රකාශ පිළිබඳ දැනුම්දීම් සමාලෝචනය කිරීමට පැහැදිලි සහ ඵලදායී ක්‍රියාදාම තිබීම. එවිට ඔවුන්ට එවැනි අන්තර්ගතයන්ට ප්‍රවේශය ඉවත් කිරීමට හෝ දුබල කිරීමට හැකිය. ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීම සහ ද්වේෂ සහගත හැසිරීම් ප්‍රවර්ධනය කිරීම තහනම් බව පැහැදිලි කරන පරීක්ෂණ සහ රීති හෝ ප්‍රජා මාර්ගෝපදේශ ප්‍රසිද්ධ කිරීම,
- අවසර නොලබන අන්තර්ගත වර්ග පිළිබඳව පරිශීලකයන්ට ඉගැන්වීම සහ දැනුවත් කිරීම, සියලුම දේශීය භාෂාවලින් පහසුවෙන් තේරුම් ගතහැකි සහ පොදු ප්‍රතිපත්ති හරහා පරිශීලකයන්ගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව ආරක්ෂා කිරීමට කැපවීම,
- ඩිජිටල් නිශ්පාදනයන්, යහපත් අරමුණු සදහා යොදා ගැනීම යෝග්‍ය බව සහ එය පරිශීලකයන්ට හෝ සමාජයට අනතුරුදායක නොවන බව සහතික කිරීම සදහා නව නිශ්පාදනවල තත්ත්වයන් පරීක්ෂා කළ යුතුය. එසේම සමාජ මාධ්‍ය වේදිකාවල යහපත් ප්‍රවණතා බෙදාගැනීම වැඩි දියුණු කිරීම සඳහා සමාගම් අතර සහයෝගීතාව තීව්‍ර කිරීම,
- සමාජ මාධ්‍ය විවිධ හඬවල් සඳහා, විශේෂයෙන් ම ආන්තික සහ අඩු නියෝජනයක් ඇති ප්‍රජා කණ්ඩායම් සඳහා විවෘත වේදිකාවක් ලෙස පැවතිය යුතුය. මෙම දෘෂ්ටිකෝණ සුරැකෙන අන්දමින් ඇල්ගොරිතම (Algorithmic) නිර්මාණ කිරීම සහ අන්තර්ගතයන් ප්‍රමිතිකරණය කළ යුතුය,
- ස්ත්‍රීන්ට සහ සංඛ්‍යාත්මකව සුළු ජාතීන්ට දැඩි ලෙස බලපෑම් එල්ල කරන සහ පීඩාවට පත් කරන ලෙස බලපාන ස්ත්‍රී විරෝධී බව, වර්ගවාදය, ප්‍රචණ්ඩ තර්ජන සහ හිරිහැරවලට එරෙහිව වඩා ශක්තිමත් ආරක්ෂාවක් සැපයීම,
- උත්පාදක කෘතිම බුද්ධිය (Generative AI) භාවිතා කරමින් නිශ්පාදනය කරන කරන ලද හෝ වැඩි දියණු කරන ලද අන්තර්ගතයන් හඳුනාගැනීම සහ පැහැදිලිව ලේබල් කිරිම,

# ආණ්ඩුවල වගකීම්

- අන්තර්ජාලය තුළ තොරතුරුවල නිරවද්‍යතාවය, අනුකූලතාව, විශ්වසනීයත්වය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන අතර, ප්‍රකාශනයේ නිදහස ඇතුළු මානව හිමිකම් පිළිගන්නා සහ ආරක්ෂා කරන ඔන්ලයින් පරිසරය වඩා ශක්තිමත් කිරීම,
- විවෘත, ආරක්ෂාකාරී සහ සමාන අන්තර්ජාල පහසුකම් ලබා දෙමින් සහ තොරතුරු වෙත ස්ථාවර ප්‍රවේශය සහතික කිරීම සඳහා Internet Slowdowns හෝ Shutdowns වළකමින් අන්තර්ජාල නිදහස වෙනුවෙන් රජය විසින් කරන ලද එකඟතාවයන්ට ගරු කිරීම *
- තොරතුරුවල විශ්වාසවන්තභාවය සහ ආන්තික ප්‍රජාවන්ගේ ආරක්ෂාව තහවුරු කරන අතර අන්තර්ජාලය හරහා වෛරය, ප්‍රචණ්ඩත්වය, Disinformation, සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැළකීම්වලට පොළඹවන සුළු අන්තර්ගතයන්ට එරෙහිව සටන් කිරීමේදී ශ්‍රී ලංකාව අත්සන් කර ඇති සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) වැනි ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම සහ ඒවා අවභාවිතා කිරීම වැළැක්වීම,
- පරිශීලකයන්ගේ පුද්ගලික තොරතුරුවල ආරක්ෂාව සහ රහස්‍යභාවය සහතික කිරීම සඳහා පරිශීලකයන්ගේ පුද්ගලිකත්වය සහ දත්ත පිළිබඳ නිශ්චිත නීති ජාත්‍යනතර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම,
- ඕනෑම නෛතික ක්‍රියාවලියක්, ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරුවල නිරවද්‍යතාවය, අනුකූලතාව සහ විශ්වසනීයත්වය ප්‍රවර්ධනය කරන 'ජාත්‍යන්තර ප්‍රමිතීන්ට' අනුකූල වන බවට සහතික කිරීම සහ තහවරු කිරීම,
- Misinformation සහ Disinformation අන්තර්ජාලය හරහා ව්‍යාප්තවන ක්‍රම පිළිබඳ පර්යේෂණ සඳහා සහය වීම සහ තොරතුරුවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තක්සේරු කිරීම සඳහා පරිශීලකයන්ගේ හැකියාව වැඩිදියුණු කිරීමට ජාතික අධ්‍යාපන විෂය මාලාවට ඩිජිටල් සාක්ෂරතාවය විෂයක් ලෙස එක් කිරීම,
- තොරතුරුවල විනිවිදභාවය සහ විශ්වාසවන්තභාවය පවත්වා ගැනීම සඳහා, සමාජ මාධ්‍ය වේදිකා ඇතුළුව ඔන්ලයින් හරහා සිදු කරන සියලු ම දේශපාලන ප්‍රචාරණ තුළ ඇති දැන්වීම් සහ පණිවිඩ, එම ප්‍රචාරණවල මුද්‍රිත පත්‍රිකා, සහ වෙළඳ දැන්වීම් හා සමානව අනුග්‍රහය ලද ඒවා බව පැහැදිලිව දැක්වීම,
- ආන්තික ප්‍රජාවන්ගේ ආරක්ෂාව සහතික කරන අතරම වෛරී ප්‍රකාශ සහ Misinformation and Disinformation වලට එරෙහිව සටන් කිරීමට නිවැරදි සහ විශ්වාසනීය තොරතුරු සපයන ප්‍රති-පණිවිඩ ව්‍යාපාර (Counter-messaging campaigns) සඳහා සහාය වීම,

* *Honour the commitment made by the government on net neutrality at the Global Conference on Cyber Space in New Delhi on November 23, 2017 to 'preserve the Internet as a fair and level playing field', and refrain from Internet slowdowns or shutdowns to ensure consistent access to information.*

# මාධ්‍ය සංවිධානවල හා සිවිල් සමාජයේ වගකීම්

- අන්තර්ග්‍රහණය, විවිධත්වය සහ බහුත්වවාදය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ රබාත් ක්‍රියාකාරී සැලැස්මෙහි (Rabat Plan of Action) ඇති අවධාරණයට අනුකූලව, ඩිජිටල් අවකාශ ඇතුළුව අවදානමට ලක් විය හැකි ප්‍රජාවන් සහ ආන්තික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ තහවුරු කිරීම සඳහා ශක්තිමත්, නිරෝගී, හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට ආණ්ඩුවට බලපෑම් කිරීම දිරිමත් කිරීම,
- වත්මන් නීති සම්පාදන සන්දර්භය තුළ පරිශීලකයන්ව ඔවුන්ගේ ඩිජිටල් අයිතීන් පිළිබඳව දැනුවත් කිරීම, මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාවය සහ ඩිජිටල් ආරක්ෂාව සිවිල් අයිතිවාසිකම් පිළිබඳ දිගුකාලීන මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපාර දියත් කිරීම සඳහා සහය දීම සහ ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම, ජාතික විෂය මාලාවට ඩිජිටල් සාක්ෂරතාවය ඇතුළත් කිරීමට ආණ්ඩුවට බලපෑම් කිරීම,
- සන්දර්භය තුළ සහ සත්‍ය හා සංවේදී ආකාරයෙන් වාර්තා කිරීමේ මාධ්‍ය වගකීමට අනුකූලව, සමාජ මාධ්‍යවල ප්‍රකාශිත Misinformation සහ Disinformation හෙළිදරව් කිරීම සහ නිවැරදි කිරීම,
- ලිපි, තීරු, හෝ විද්‍යුත්/ ගුවන්විදුලි විකාශනවලින් අපහාසාත්මක හෝ ද්වේෂසහගත අන්තර්ගතයන් ඉවත් කරන කතුවැකි ප්‍රතිපත්තියට (Editorial Policy) අනුකූලව ඒවාට ක්‍රියාකාරීව ප්‍රතිරෝධය දක්වන සහ වෛරී ප්‍රකාශවලට එරෙහිව සටන් කරන නිල සාම්ප්‍රදායික ධාරාවේ මාධ්‍ය වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ගිණුම් සඳහා අදහස් (Comments) Moderation සහ අන්තර්ගත සැකසීමේ ප්‍රතිපත්ති හඳුන්වා දීමට සහය වීම, වෙනස් කොට සැළකීම්වල හානි - ප්‍රජාතන්ත්‍රවිරෝධී තත්ත්වයන් පිළිබඳව මහජනතාවගේ අවධානයට යොමු කිරීම සහතික කරන අතර ම, සන්දර්භය; සත්‍ය හා සංවේදී ආකාරයෙන් වාර්තා කිරීමට වගබලා ගැනීමේ මාධ්‍ය වගකීම ප්‍රවර්දනය කිරීමට සහය විම,
- නොඉවසීමට එරෙහිව කතා කිරීමේ සහ විවෘත සංවාද ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම අවධාරණය කරමින්, වෛරී ප්‍රකාශවලට එරෙහිව සටන් කිරීමට ප්‍රති-පණිවිඩකරණ ව්‍යාපාර (counter-messaging campaigns) නිර්මාණය කිරීම ට සහය වීම,
- සිවිල් සමාජය සහ ජාතික මානව හිමිකම් ආයතන විසින් මෙහෙයවනු ලබන යාන්ත්‍රණ හා සංවාද අවකාශ නිර්මාණය කිරීම සහ ඒවාට සහයවීම තුළින් අන්තර්-සංස්කෘතික සහ අන්තර්-ආගමික අවබෝධය සහ ඉගෙනීම පෝෂණය කිරීම,
- ආගම හෝ විශ්වාසය ඇතුළු කාරණා සම්බන්ධයෙන් විවෘත හා ශක්තිමත් සංවාද අවකාශයක් සහතික කිරීම සහ ආගම හෝ විශ්වාසය මත පදනම්ව වෙනස් කොට සැළකීමට ලක් වීමෙන් පුද්ගලයන් ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා පෙනී සිටීම. (ආගම් ඇදහීමේ හෝ ආගමික විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) ආරක්ෂා කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම,)
- වෛරී ප්‍රකාශවලට එරෙහිව ස්ථිරසාරව සහ කඩිනමින් කතා කිරීමට ආගමික නායකයන් දිරිමත් කිරීම සහ වෛරය ඇති කිරීමට ප්‍රතිචාර ලෙස ප්‍රචණ්ඩත්වය යොදා ගැනීම කිසිවිටෙකත් ඉවසිය නොහැකි බව ඔවුන්ට පැහැදිලි කිරීම. ප්‍රචණ්ඩත්වයට පොළඹවන සිදුවීම් පිළිබඳ පැමිණිලි භාර ගැනීම සඳහා සමානාත්මතා ආයතන (Equality Bodies) පිහිටුවීමට හෝ ජාතික මානව හිමිකම් ආයතන වැඩිදියුණු කිරීමට සහය වීම,

# Generative AI
## (Generative Artificial Intelligence)
## පසුබිම

ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය හි Generative AI භාවිතා කිරීමෙන් ඇතිවිය හැකි ආචාරධාර්මික ගැටළුවලට අදාළව, වැරදි (Errors) හෝ පක්ෂග්‍රාහීත්වය, ලේඛන සොරකම (Plagiarism), සහ "බුද්ධි හීන සහ ඒක වර්ගීය" අන්තර්ගතයන් නිර්මාණය කිරීමේ අවදානම යන ඒවා ඇතුළත් වේ. මීට අමතරව, මහජන විශ්වාසය අඩපණ කිරීමට සහ ජනමාධ්‍ය හි විශ්වසනීයත්වය නැති කිරීමට Generative AI අන්තර්ගතවලට ඇති හැකියාවද සැළකිල්ලට භාජනය වේ. මාධ්‍ය සංවිධාන විසින්, මාධ්‍ය අන්තර්ගතයේ බුද්ධිමය දේපල අයිතිවාසිකම්වලට ගරු නොකරන AI භාවිතයට එරෙහිව අනතුරු අඟවා ඇත. ඒ එය විශ්වාසදායක නොවන අන්තර්ගතයන් උත්පාදනය කිරීමට හේතු විය හැකි බැවිනි. ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම Generative AI අන්තර්ගතයක් සඳහා වගකියනු ලැබීම සහ තුන්වන පාර්ශ්වයේ බුද්ධිමය දේපල අයිතිවාසිකම් නොසැළකිලිමත් ලෙස උල්ලංඝනය කිරීමේ හැකියාව තිබීම වැනි නීතිමය කාරණාද ඇත.

ජනමාධ්‍ය තුළ Generative AI අන්තර්ගතයේ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා සත්‍ය-අසත්‍ය බව පරීක්ෂා කිරීමේ දැඩි ක්‍රියාවලි, මාර්ගෝපදේශ සහ මානව අධීක්ෂණ මාධ්‍යවේදීන් හට ක්‍රියාත්මක කළ හැකිය. විනිවිදභාවය සහ හෙළිදරව් කිරීම ඉතා වැදගත් වන අතර, මාධ්‍ය ආයතන ප්‍රවෘත්ති නිෂ්පාදනයේදී AI භාවිතය පිළිබඳව විනිවිද භාවයකින් යුක්ත විය යුතු අතර, AI මගින් අන්තර්ගතයන් නිර්මාණය කරන විට ඒ බව පැහැදිලිව අනාවරණය කළ යුතුය. ප්‍රවෘත්ති වාර්තාකරණයේ පරිපූර්ණ බව පවත්වා ගැනීම සඳහා සත්‍ය-අසත්‍ය බව තහවුරු කරමින් Misinformation / Disinformation වලට එරෙහිව සටන් කිරීම අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, Generative AI අන්තර්ගතයන් මිනිසා විසින් නිර්මාණය කළ අන්තර්ගත හා සමානවම නිවැරදි සහ විශ්වසනීය වන බව සහතික කිරීම සඳහා කතුවැකිවල ප්‍රමිතිගත බව පවත්වා ගැනීම, කරුණු පරීක්ෂා කිරීමේ ප්‍රොටෝකෝල, මූලාශ්‍රවල සත්‍ය-අසත්‍ය බව පරීක්ෂා කිරීම සහ මාධ්‍ය ආචාරධර්ම සලකා බැලීම් අත්‍යවශ්‍ය වේ. මෙම පරිචයන් ආරක්ෂා කිරීමෙන්, මාධ්‍යවේදීන්ට වගකීමෙන් යුතුව ජනමාධ්‍යක් තුළ ආචාරධාර්මිකව Generative AI භාවිතා කළ හැකිය.



# සමාජ මාධ්‍ය ප්‍රකාශනය සහ Generative AI (Generative Artificial Intelligence)

**අපට විශ්වාසනීය, පිළිගත හැකි, වෘත්තීයමය සහ අපක්ෂපාතී පුරවැසි මාධ්‍ය සඳහා, මාධ්‍ය අන්තර්ගත නිර්මාණය කිරීමට (අවශ්‍ය වන සෑම විටම) ආචාරධාර්මිකව AI යොදාගෙන නිර්මාණය කරන ලද මෙවලම්, වේදිකා හෝ Apps භාවිතා කිරීම ඉතා වැදගත් වේ. අප කැපවී සිටින ප්‍රධාන අංශ පහ (05) නම්,**

- **විනිවිදභාවය:** Generative AI යොදාගෙන නිෂ්පාදනය කරන අන්තර්ගතයන් පැහැදිලිව ලේබල් කරනු ලැබේ. එවිට ඒවා සම්පූර්ණයෙන් ම මිනිසාගෙන් මැදිහත් වීමෙන් තොර බව, එනම් කෘතිම මාධ්‍යයක් වන බව ජනයා  දැන ගනිති. උදාහරණයක් ලෙස සම්පූර්ණයෙන් ම Generative AI මගින් නිර්මාණය කර ඇති ලෙස ලේබල් කිරීම, මෙය ප්‍රේක්ෂක විශ්වාසය ගොඩනැගීමට සහ රඳවා ගැනීමට උපකාරී වේ.
- **නිරවද්‍යතාව:** Generative AI මගින් නිෂ්පාදනය කළ අන්තර්ගත (Generative AI) සැළකිලිමත්ව පරීක්ෂා නොකළහොත්, ඒවා ව්‍යාජ දර්ශන සහ පක්ෂග්‍රාහී දෘෂ්‍ය නිමැවුම් හරහා අසත්‍යයන්, Disinformation සහ Misinformation පැතිරවිය හැකිය. තොරතුරු මත රඳා පවතිමින් විශ්වාසනීය මූලාශ්‍ර භාවිතා කර Generative AI අන්තර්ගත ප්‍රකාශයට පත් කිරීමට පෙර පරීක්ෂා කරනු ලැබේ. මෙම ක්‍රියාවලියට සහය පිණිස නව මෙවලම් ඇතුළු කර්මාන්තවල තත්ව පරීක්ෂාව සඳහා දියුණු නිර්ණායක භාවිතා කිරීමත් අත්‍යවශ්‍ය වනු ඇත.
- **වගවීම:** Generative AI අන්තර්ගතය හානියක් කරන්නේ නම් ගැටළු විසඳීමට පැහැදිලි ප්‍රතිකර්ම ක්‍රියාවලි තිබීමත්, පාඨකයන් සහ මාධ්‍ය පරිශීලකයන් ඇතුළු පීඩාවට පත් වූ පුද්ගලයන්ට වාර්තා කිරීමට සහ සාවද්‍යභාවය ප්‍රශ්න කිරීමට ක්‍රම තිබිය යුතුය.
- **අයිතීන්ට ගරුකිරීම:** භාවිතා කරන Generative AI මෙවලම්, ආචාරධර්ම ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දක්වා ඇති මූලික අයිතිවාසිකම් ඇතුළුව මූලික මානව හිමිකම් ආරක්ෂා කළ යුතුය. ඒවා හානිකර, පක්ෂග්‍රාහී සහ ඒකාකෘති බීජ වැපිරීම, පැතිරවීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.
- **විශේෂඥයන් සම්බන්ධ කරගැනීම:** යහ-භාවිතයන් නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සහ Generative AI භාවිතා කරන විට අදාළ විෂයානුබද්ධ විශේෂඥයන්, විද්වතුන් සහ සිවිල් සමාජය වැනි විවිධ කණ්ඩායම්වලින් අදහස් ලබා ගැනීම, ස්වාධීන විගණනය සහ අධීක්ෂණය එය භාවිතා කරන අභ්‍යන්තර ක්‍රියාවලි සහතික කිරීමට උපකාරී වන අතර, Generative AI සම්බන්ධ බාහිර නිමැවුම් එවිට මහජන අවශ්‍යතා සඳහා සේවය කරයි.

එවිට එය, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන අතරම, මහජනතාව දැනුවත් කිරීම සඳහා එහි විභවය උපයෝගී කර ගැනීමටත්, පුරවැසිය මාධ්‍ය අතුලු මාධ්‍ය  සෑම විටම මහජන අධීක්ෂණයෙන් යුතුව විනිවිදභාවයෙන්, නිවැරදිව හා වගවීමෙන් Generative AI භාවිතා කළ යුතුය.

# SIGNATORIES

Jaffna Press Club
Eastern Provinces Journalists forum
Centre for Policy Alternatives
Human Elevation Organization
Sri Lanka Working Journalists Association
ActNow Youth Campaign
Wedabima Media collective
National Collaboration Development Foundation
Best Vision foundation
Low & Society Trust
SARVODAYA Shramadana Movement
Movement for Land and Agricultural Reform
Sri Lanka Muslim Media Forum
Internet Media Action
maatram.org
vikalpa.org
groundviews.org
minormatters.org



COLOMBO | 2019 - 2024

**social media declaration**

Version 2.0

#EngageSMinSL

## "Hardwired for Life: Human Rights Online and Offline'

socialmedialanka.org |@SMDsrilanka | facebook.com/SMDsrilanka | sampath@cpalanka.org | +94 777 248304